# ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය හා රැකියා වෙළෙඳපොළ පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යනයක්

ඒ.ඒ.පී.එම්. මධුහාෂිණී[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ ආර්ථීක සංවර්ධනය කෙරෙහි ප්‍රබල බලපෑමක් සිදුකරන සාධක ලෙස ශ්‍රම බලකාය, රැකියා වෙළෙඳපොළ ආදී සංකල්ප නම් කළ හැක. මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව, උක්ත ක්ෂේත්‍රයේ වර්තමාන හැසිරීම කවර ආකාරයෙන් සිදුවන්නේද? යන්න අධ්‍යයනය කිරීමයි. සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස ඉහළ ආර්ථීක වෘද්ධියක් කරා ළඟා වීමට ශ්‍රී ලංකාව සෑම විටම උත්සහ කරයි. එහිදී පූර්ණ සේවා නියුක්තියක් ඇතිකරගැනීම ශ්‍රී ලංකාව සතු සාර්ව ආර්ථීක අරමුණකි. ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය හා රැකියා වෙළෙඳපොළ ආශ්‍රිතව පවතින්නාවූ සාධනීය තත්වයන් හඳුනාගැනීමත් ඇතිවී ඇති ගැටලු සඳහා යෝග්‍ය විසඳුම් ඉදිරිපත් කිරීමත් මෙම පර්යේෂණයේ අරමුණ යි. ද්විතියික තොරතුරු මූලාශ්‍ර උපයෝගී කොටගෙන ලබාගත් දත්ත සඳහා සංඛ්‍යානමය ශිල්ප ක්‍රම යොදා ගනිමින් විශ්ලේෂණය කර ඉහත පර්යේෂණයේ ගැටලුව සඳහා විසඳුම් ලබා ගැනීම පර්යේෂණ සැලැස්ම විය. එහිදී මෙම පර්යේෂණයේ ක්‍රමවේදය ලෙස 1977 වසරේ සිට 2104 වසර දක්වා කාලය තුල ශ්‍රම බලකාය හා රැකියා වෙළඳපළ ආශ්‍රිත ද්වීතයික දත්ත උපයෝගී කොටගෙන තිබේ. දත්ත විශ්ලේෂණය සඳහා වගු , ප්‍රස්තාර සටහන් මෙන්ම සංඛ්‍යානමය විශ්ලේෂණයන් යොදා ගන්නා ලදී. ඒ අනුව ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය හා රැකියා වෙළෙඳපොළ පිළිබඳව අධ්‍යයනය කිරීමේදී වර්තමානයේ දී එක් එක් වෘත්තිමය අංශයන් හි ප්‍රසාරණයන් හෝ සංකෝචනයන් සිදුවන බව අනාවරණය විය. එමෙන්ම උගත් තරුණ ශ්‍රම හිඟය, බොහෝ ආයතන තම ව්‍යාපාර කටයුතු පුළුල් කිරීමේ දී මුහුණ දෙන ප්‍රධානම ගැටලුවක් බවට පත්වී තිබේ. ඒ සඳහා අධ්‍යාපන හා වෘත්තීය පුහුණු කිරීමේ පද්ධතියක් ප්‍රතිසංස්කරණය කිරීමේ අවශ්‍යතාවයක් පවතී. තවද ශ්‍රම බලකාය වෙත වැඩිපුර කාන්තාවන් ආකර්ෂණය කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ඇරඹීම ද කාලීන අවශ්‍යතාවයකි.

**මුඛ්‍ය පද :** *ශ්‍රම බලකාය, රැකියා වෙළෙඳපොළ, ආර්ථීක සංවර්ධනය*

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
aappmm.piyumi@gmail.com